# 11 තැනට ඔබින ලෙස හැසිරෙමු

අපි සමාජයක මිස හුදකලාව ජීවත් වන්නෝ නො වෙමු. සමාජයක ජීවත් වන විට හිතුමනාපයට, ආවාට ගියාට කථාබහ කිරීමේ හෝ හැසිරීමේ හෝ අයිතියක් අපට නැත. ස්ථානයට, අවස්ථාවට හා පිරිසට ගැළපෙන ලෙස කතා බහ කිරීමට හා හැසිරීමට අපි බැඳී සිටිමු. සමාජානුයෝගය යන වචනයෙන් අදහස් කෙරෙන දේ තුළ මෙම ලක්ෂණය ද ඇත. වැරැදි වැඩ කරන සමාජයක තමනුත් වැරැදි කිරීම හෝ එම සමාජයට අනුකූල වන සේ අයෝග්‍ය වචන භාවිත කිරීම හෝ සමාජානුයෝගය නො වේ. එය සමාජයක අභිවෘද්ධිය හා සම්බන්ධ වූවක් මිස පරිහානියට අනුබල දෙන්නක් නො වේ. මානව සබඳතා පැවැත්වීමේ දී මෙම කාරණය විශේෂයෙන් සැලකිල්ලට ගතයුතු වෙමු.

ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීම සඳහා බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතනාරාමයට වැඩම කළ අවස්ථාව ගැන සිතා බලන්න. එදා පස්වග තවුසන් බුදුරදුන්ට ආමන්ත්‍රණය කළේ සමාන කෙනකුට, යහළුවකුට ආමන්ත්‍රණය කරන ආකාරයෙනි. තමාට වඩා උසස් අයකුට ඇමතීමේ දී නම කීම හෝ ආවුසෝ යි කීම සුදුසු නො වේ. විශේෂයෙන් බුදුරජාණන් වහන්සේට ඇමතීමේ දී ගරුකටයුතු ශාසනික වචන ම භාවිත කළ යුතු ය. ඒ බව බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන්ට පැහැදිලි කර දුන් සේක.

> "ඔවුහු භාග්‍යවතුන් වහන්සේට ගෞතම නාමයෙන් ද ආවුසෝ වාදයෙන් ද කතා කෙරෙති. මෙසේ කථා කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන්ට "මහණෙනි තථාගතයන්ට නාමයෙන් ද ආවුසෝ යි කියා ද කථා නො කරව්. මහණෙනි තථාගත තෙමේ රහත් ය. සම්‍යක් සම්බුද්ධයයි වදාළහ."
>
> (මහාවග්ග පාලි)

එසේ එදා භික්ෂු සමාජය ආරම්භ කරන ලද්දේ ද උචිත පරිදි වචන භාවිත කිරීමේ පාඩම උගන්වමින් ය. අපි සියලු දෙනා ම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක ශ්‍රාවිකාවෝ වෙමු. එබැවින් පස්වග මහණුන්ට බුදුරජාණන් වහන්සේ කළ අනුශාසනාව අනුගමනය කළ යුතු වෙමු. පන්සල පාසල වැනි සුවිශේෂ

ස්ථානවල දී හැසිරිය යුතු පිළිවෙළ, ස්වාමීන් වහන්සේ, ගුරුතුමා - ගුරුතුමිය ඇසුරු කිරීමේ දී හැසිරිය යුතු හා කථාබහ කළ යුතු පිළිවෙළ ආදිය ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙමු.

ඇතැම් කෙනෙක් අපේ ස්වාමීන් වහන්සේලාට ඇමතීමේ දී සාදු යන වචනය භාවිත කරති. එය කිසිසේත් නො ගැළපේ. ජෛනාගමේ ශ්‍රාවකයන් සඳහා සාධු යන වචනය භාවිත කෙරෙන නමුත් අපේ ස්වාමීන් වහන්සේට ඇමතීමේ දී එය සුදුසු නොවේ. යෝග්‍ය වන්නේ **ස්වාමීන් වහන්ස, හාමුදුරුවනේ, හාමුදුරුවන් වහන්ස** වැනි භාවිතයන් ය. පොඩි හාමුදුරුවන්ට ඇමතීමේ දී පවා පොඩි සාදු යන යෙදුම සුදුසු නැත. සමහර වැඩිහිටියෝ පොඩි උන්නාන්සේ යයි කියති. එය ද සුදුසු නොවේ. පොඩි උන්නාන්සේ යන්න භාවිත කරන්නේ ලොකු හාමුදුරු නමක් පොඩි හාමුදුරු නමකට කථා කිරීමේ දී ය. අපේ හාමුදුරුවෝ, අපේ ස්වාමීන් වහන්ස, අවසරයි අපේ හාමුදුරුවනේ, අවසරයි ස්වාමීන් වහන්ස වැනි යෙදුම්වල ශ්‍රද්ධාව මෙන් ම ගෞරවය ද ඇතුළත් ව තිබේ. අපේ රටේ සමහර පළාත්වල එබඳු ජීවිත අද ද අසන්නට ලැබේ. හාමුදුරුවෝ මුළු මහත් ජනතාවට ම අයිති ය. අපේ හාමුදුරුවෝ වන්නේ එම තේරුමෙනි. ඇමතීමේ දී පමණක් නො ව පන්සලේ ස්වාමීන් වහන්සේ පිළිබඳ කථා කිරීමේ දී ද විශේෂ ශාසනික වචන මාලාවක් ඇත. එම වචන භාවිතයට අපි හුරු පුරුදු විය යුතු වෙමු.

**ස්වාමීන් වහන්සේ**

පන්සලේ වැඩ වෙසෙති; අලුයම අවදි වෙති; දැහැටි වළඳති; මුව දෝවනය කරති; මලු අමදිති; දානය වළඳති; පැන් වළඳති; ගිලන්පස වළඳති; දැහැත් වළඳති; පැන් පහසු වෙති; ධර්මය දේශනා කරති; පිරිත් දේශනාවලට වැඩම කරති; වැඩ වෙසෙන කුටියේ සැතපෙති.

විහාරස්ථානයේ වඳින පුදන ස්ථාන ගැන සඳහන් කිරීමේ දී ද චෛත්‍ය රාජයාණන් වහන්සේ, බෝධීන් වහන්සේ වැනි ශාසනික වචන භාවිත කිරීම අපේ සිරිත ය. විහාරස්ථානයට පැමිණි විට ඔවුනොවුන් ඇමතීමේ දී ද භාවිත කෙරෙන්නේ ස්ථානෝචිත වචනයි. අසංවර වචන භාවිත කරනු නො ලැබේ. රළු වදන්වලින් බැහැර ව නිවැරැදි, කනට සැප ගෙන දෙන, ප්‍රේමනීය වූ, හෘදයාංගම වූ, ශිෂ්ට සමාජයට ගැළපෙන බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනාගේ මන වඩන වචන භාවිත කිරීම ශීලාචාර කමේ ලක්ෂණයක් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

කථා බහ කිරීමේ දී පමණක් නො ව හැසිරීමේ දී ද ඝෝෂාකාරී බවෙන් තොර ව නිශ්ශබ්දතාව සුරැකෙන සේ ක්‍රියා කිරීම අපේ පිළිවෙතයි. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයෙහි උන්වහන්සේ බැහැදැකීමට පැමිණි අයට සංවරශීලී ව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව ස්වාමීන් වහන්සේලා උපදෙස් දුන් අයුරු සඳහන් වේ.

ඔවුහු අම්බට්ඨ මානවකයාට "අම්බට්ඨ, මේ වැසූ දොර ඇතියේ විහාරයයි. නිශ්ශබ්ද ව එතැනට ගොස් සෙමෙන් පිළට පිවිස, උගුර පාදා, අගුල ළඟට නියපිටින් ගසව, එවිට බුදුරජාණන් වහන්සේ දොර හරනා සේකැ" යි කීහ.

(අම්බට්ඨ සූත්‍රය - දීඝ නිකාය)

බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාවට කැමති නිශ්ශබ්දතාවේ අගය වර්ණනා කරන ශාස්තෘවරයකු බවට අන්‍යාගමිකයන් අතර ද සුප්‍රසිද්ධියක් ඉසිලූහ. බුදුරජාණන් වහන්සේ වැඩම කරන බව දුටු වහා ම ඇතැම් ආගමික නායකයෝ තම අනුගාමික පිරිස පවා නිශ්ශබ්ද ව තබා ගැනීමට ක්‍රියා කළහ.

"පොට්ඨපාද පිරිවැජි තෙමේ දුරින් ම වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුවේ ය. දැක, 'නිහඬ වෙන්න, ශබ්ද නො කරන්න. ගෞතමයන් වහන්සේ පැමිණෙති. ඒ ආයුෂ්මත් තෙම නිහඬ බව කැමැත්තේ ය. නිහඬ බවෙ හි ගුණ කියන සුලු ය, පිරිස නිහඬ සේ දැන එළඹිය යුතු කොට සිතුවොත් යෙහෙකැ' යි සිය පිරිස සන්සුන් කළේ ය."

(පොට්ඨපාද සූත්‍රය - දීඝ නිකාය)

නිශ්ශබ්දතාවට කැමති වූ නිශ්ශබ්දතාවේ අගය වර්ණනා කළ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක ශ්‍රාවිකාවන් වන අපි ඒ බුදුරදුන් වෙනුවෙන් ඉදිකරගත් තුන්බෝ ඇති විහාරස්ථාන භූමියේ දී නිශ්ශබ්දතාවෙන් යුතු ව හැසිරිය යුතු වෙමු. මෛත්‍රී සහගත සිතුවිලි ඇති ව මෛත්‍රී සහගත වචන භාවිත කරමින් මෛත්‍රී සහගත කායික ක්‍රියාවන්ගෙන් යුක්ත විය යුතු වෙමු. විහාරස්ථාන භූමිය පිරිසිදු ව තබා ගැනීමට ද අපි බැඳී සිටිමු. පන්සලේ ස්වාමීන් වහන්සේ වැඩ හිඳින ආසන අපි පාවිච්චි නො කරමු. අප භාවිත කරන්නේ මිටි ආසනයක් හෝ පැදුරකි. සුදුවතින් සැරසී හිස්වැසුම් පාවහන් නොමැති ව ආචාරශීලී ලෙස කටයුතු කිරීමත් ස්ථානෝචිත හැසිරීම් ය.

අපේ පාසල ද පූජනීය ස්ථානයක් මෙනි. ඒ අපේ නුවණැස පාදන තැනයි. ඒ සඳහා අපට මඟ පෙන්වන අපේ ආදරණීය ගුරු මෑණිවරුන්, ගුරු පියවරුන් සිටින තැනයි. එහි දී ක්‍රීඩා කළත් එසේ කළ යුත්තේ ක්‍රීඩා කරන්නේ පාසල් භූමියේ බව අමතක නො කරමින් ය. භාවිත කෙරෙන හැම වචනයක් ම රළු බවෙන් තොර, කුපිත කරවන ස්වභාවයෙන් තොර නොමනා විහිළු තහළු ආදියෙන් තොර ප්‍රේමනීය ඒවා ම විය යුතුයි.

සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට **ආයුබෝවන්, තෙරුවන් සරණයි** වැනි ආශිර්වාදයක් අන්‍යෝන්‍ය වශයෙන් භාවිත කිරීමට හැකි නම් එය ඉතා වැදගත් වේ.



11.1 රූපය

අපේ පාසලේ සේවය කරන ගුරු පිරිසගෙන් අපට උගන්වන්නේ ගුරු පියවරුන් ගුරු මෑණිවරුන් කිහිප දෙනකු පමණකි. එසේ වුව ද පාසලේ සියලු ම ගුරු පිරිසට අපි ගරු කළ යුතු වෙමු. ප්‍රාථමික ශ්‍රේණිවල දී අපට ඉගැන්වූ ගුරු මෑණිවරුන් ගුරු පියවරුන් දැන් අපට ඉගැන්වීම් නො කළත් ඉමහත් භක්තියෙන් හා ගෞරවයෙන් අපි ඒ ගුරු පිරිසට සැළකිය යුතු වෙමු. පන්ති කාමරයේ දී පමණක් නොව එළිමහනේ දී ද ගුරු මෑණිවරුන් පියවරුන් දුටු විට හුනස්නෙන් නැගී සිට ගරු කිරීමට අප පුරුදු විය යුතුයි. අප කීප දෙනකු එකට ගමන් කරන විට ඉදිරියෙන් ගුරුතුමකු හෝ ගුරුතුමියක පැමිණියහොත් පසෙකට වී ඉඩහැරීම අපට උරුම වූ උතුම් චාරිත්‍රයකි.




11.2 රූපය

පාසල් පරිශ්‍රය අපවිත්‍ර නො වන ලෙස හැසිරීමටත් අපවිත්‍ර වී ඇත්නම් පිරිසිදු කිරීමටත් අපි බැඳී සිටිමු. පාසලේ බුදු මැදුරට ඇතුළු වන්නේ ද පන්සලේ බුදු මැදුරට ඇතුළු වන ආකාරයෙන් ම ය. ශ්‍රද්ධාව හා ගෞරවය පෙරදැරි කරගෙන ය. ස්වාමීන් වහන්සේ නමක්

ප්‍රශ්නයක් විමසූ විට **ඔව්** කිවයුතු තැන, **එහෙයි** කියන්නාක් මෙන් ගුරුතුමා ගුරුතුමිය ප්‍රශ්නයක් විමසූ විට **එහෙමයි** කියා පිළිතුරු දීම අපේ පිළිවෙතයි. මානව සබඳතා පැවැත්වීමේ දී ස්ථානයට, පුද්ගලයින්ට ගැළපෙන ලෙස අන්‍යෝන්‍ය ගෞරවය සුරැකෙන පරිදි කායික වාචසික හැසිරීම් මනාව සංවිධානය කර ගැනීමේ අවශ්‍යතාවයි, මෙයින් අවධානයට යොමු කෙරෙන්නේ.

**සාරාංශය**

- අපි පන්සලට යන විට සුදු ඇඳුමින් සැරසෙමු.
- පුද බිමට ඇතුළු වීමට පෙර පාවහන් හිස්වැසුම් ගලවමු.
- ස්වාමීන් වහන්සේ ඇමතීමේ දී සාදු වැනි අනුචිත ව්‍යවහාර බැහැර කර හාමුදුරුවන් වහන්ස, ස්වාමීන් වහන්ස වැනි වචන භාවිත කරමු.
- බුදුන්, චෛත්‍යය, බෝධිය වැනි වචන වෙනුවට බුදුරජාණන් වහන්සේ, චෛත්‍යරාජයාණන් වහන්සේ, බෝධීන් වහන්සේ වැනි වචන භාවිත කරමු.
- ස්වාමීන් වහන්සේගේ දෛනික කාර්යයන් හැඳින්වීමේ දී ශාසනික වචන ම භාවිත කරමු.
- පන්සල් භූමිය තුළ නිශ්ශබ්දතාව සුරැකෙන පරිදි ම හැසිරෙමු.
- වන්දනාවට පැමිණෙන්නන් සමඟ හෘදයාංගම ව කථා කරමු. සැදැහැ වඩන අදහස් ම ප්‍රකාශ කරමු.
- පන්සල් භූමිය අපිරිසිදු නො කරමු. පිරිසිදු කළ යුතු තැන් සිය කැමැත්තෙන් ම පිරිසිදු කරමු.
- පාසල් දිනවල නියමිත ඇඳුමෙන් ම පාසල් යමු.
- මුළු ගුරු මණ්ඩලය කෙරෙහි ම ආදරය ගෞරවය දක්වමු.
- ගුරුතුමා, ගුරුතුමිය ඇමතීමේ දී ආදරය ගෞරවය පෙරටු කරගත් වචන ම භාවිත කරමු.
- පන්සලේ දී මෙන් ම පාසලේ දීත් මෛත්‍රී සහගත ව ම කායික වාචසික ක්‍රියාවන්හි යෙදෙමු.

**ක්‍රියාකාරකම**

1. ස්වාමීන් වහන්සේලා හා ගුරු පිරිස සමඟ කථා කිරීමේ දී විශේෂ වචන මාලාවක් භාවිත කිරීම සුදුසු යයි ඔබ තීරණය කරන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.
2. පන්සල සහ ස්වාමීන් වහන්සේ සම්බන්ධ ව භාවිත කෙරෙන ශාසනික වචන හැකිතාක් එකතු කර අකාරාදි පිළිවෙළට ලියන්න.
3. යහපත් දරුවකු තුළ තිබිය යුතු ගුණාංග පහක් ලියන්න.

**පැවරුම**

බෝධි පූජාවකට ආරාධනා කිරීමට පන්සලට ගිය ශිෂ්‍යයකු හා ස්වාමීන් වහන්සේ අතර ඇති වූ දෙබසක් නිර්මාණය කරන්න.


නොමිලේ බෙදාහැරීම පිණිසයි.